සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය :-** ....................................................................................... **කාලය : පැය 02 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

### I කොටස

- ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.

(1) ''නරියා උඩ බලාගෙන හයියෙන් <u>අඬපාලා</u> ඇහුවා. ඈ අප්පේ කාට දුකුමක් ද ඔය තඩේ ගෙනියන්නෙ?'' කියලා.

(1) 'හූ' කියා (2) ශබ්ද කර (3) කෑ ගසා (4) අත්පුඩි ගසා

(2) <u>සුදහ ගින්දරේ</u> පසු වන වැද්දන්ගේ බඩට වුවමනා කරන්නේ රසයට වඩා ආහාර ප්‍රමාණය වැඩි වීමකි.

(1) වේදනාවෙන් (2) බඩගින්නෙන් (3) වෙහෙසවීමෙන් (4) දැඩි උණුසුමෙන්

(3) මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනය කුමක් ද?

(1) අවබෝධය (2) නුවණ (3) ළමයා (4) අක්ෂර

(4) උක්ත පද පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) පිරිසක්, ළමයෙකු
(2) ළමයින්, ගුරුවරු
(3) කාන්තාවක්, මිනිසුන්
(4) ළමයි, ගුරුවරයෙක්

(5) '<u>රූ</u>පය' යන පදයේ පිල්ලම කුමක් ද?

(1) දීර්ඝ ඇදපිල්ල (2) ඇලපිල්ල (3) දීර්ඝ පාපිල්ල (4) ගැටපිල්ල

(6) ''අපි'' යන පදය;

(1) උත්තම පුරුෂ බහුවචන පදයකි
(2) උත්තම පුරුෂ ඒකවචන පදයකි.
(3) ප්‍රථම පුරුෂ බහුවචන පදයකි.
(4) මධ්‍යම පුරුෂ බහුවචන පදයකි.

(7) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය කුමක් ද?

(1) මර්දනය (2) පුස්ථකාල (3) ප්‍රශ්ණ (4) ප්‍රතම

(8) ''ආගන්තුක'' යන පදයට විරුද්ධ පදය කුමක් ද?

(1) ස්වදේශික (2) නේවාසික (3) සාමාන්‍යය (4) විශේෂ



LIVEWORKSHEETS

(9) ''ළපටි ගොයම් දලුත් එක්ක නටන්න මං ආසයි'' මෙම කවි පදයේ විශේෂණ පදය කුමක් ද?

(1) ගොයම් (2) ළපටි (3) නටන්න (4) එක්ක

(10) ජය ලැබූ සෙබළු දෙරණ සිප ගත්හ.

ඉරි ඇඳි පදයට සමාන පදයක් ලියන්න. ..........................................................................................

(11) ඔබට යහපතක් වේවා

ඉහත සඳහන් වාක්‍යය විරාම ලකුණු යොදා නැවත ලියන්න.

....................................................................................................................................................

**I පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය වරහන තුළින් තෝරා ලියන්න.**

(12) ..................................................................... පෙරහැර අලංකාර කරති. (ඇත්තු / ඇතුන්)

(13) ..................................................................... සුළඟින් සෙලවෙයි. (වෘක්ෂ / වෘක්ෂයෝ)

(14) දුම්රිය සෙමින් ධාවනය ..................................................................... (වෙති / වෙයි)

(15) මව දරුවන් ..................................................................... (රකින්නීය / රැක්කෝ ය.)

(16) මම පුවත්පත ..................................................................... (කියෙව්වාය / කියවූවෙමි)

**I පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.**

(17) දී කිරට ..................................................................... සාක්කිලූ.

**I 18 - 20 ප්‍රශ්නවල සඳහන් වාක්‍යය සඳහා සුදුසු පද වරහන තුළින් තෝරා ලියන්න.**

(18) හේනේ ..................................................... වෙත ගිය ඔහු සරුවට වැඩී තිබුණු ..................................................... දැක සතුටු වූයේය. (පැළ/පැල)

(19) වෙහෙසට පත් වූ වෙළෙන්දා ..................................................... බිම තබා කොස් ..................................................... මත වාඩි විය. (කද / කඳ)

(20) ..................................................... පුරා ඇවිද ගිය සමන්ගේ පාදයේ තිබූ ..................................................... ඔහුට වේදනාකාරී විය. (වණය / වනය)

(ලකුණු 2 5 20 = 40)



LIVEWORKSHEETS